රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක:PF 437

මගේ අංකය. පීඑෆ්/ එෆ් එස් /අරමුදල්/එම්ජී 25/152,
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01,
2009.09 . 18

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථා මණ්ඩල, රාජ්‍ය බැංකු,
විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන ප්‍රධානීන්
සහ රජයට අයත් සමාගම්වල සභාපතිවරුන් වෙත.

## රාජ්‍ය ආයතන සඳහා සාමාන්‍ය රක්ෂණ ආවරණයන් සැලසීම

01. සියළුම රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන තම ආයතන අවශ්‍යතාවයන් අනුව පහත නම් සඳහන් සාමාන්‍ය රක්ෂණ ආවරණයන් ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් පමණක් සලසා ගත යුතුවේ.

1.1 (අ) සමුද්‍රීය රක්ෂණය
(ආ) ගිනි රක්ෂණය
(ඇ) මෝටර් රථ රක්ෂණය
(ඈ) සාමාන්‍ය අනතුරු රක්ෂණය

1.2 රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශවලට අයත් සහ අත්කර ගත් දේපළ රක්ෂණය

1.3 රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්ව විද්‍යාල, රාජ්‍ය බැංකු , රජයට පූර්ණ අයිතිය සහිත සමාගම් හා රජයට වැඩි කොටසක් හිමි සමාගම්වල සේවකයන් සඳහා වන සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

02. ඉහත සඳහන් රක්ෂණ යෝජනා ක්‍රමවලට ඇතුළත් නොවන අනෙකුත් සියළුම රක්ෂණ ආවරණයන් සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් පමණක් ලබාගත යුතුවේ.

03. රාජ්‍ය අංශයට අයත් සියළුම ආයතන තම ආයතනයට අවශ්‍ය වන සියළුම රක්ෂණ ආවරණයන් සෘජුවම ජාතික රක්ෂණ භාර අරමුදලෙන් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් ලබා ගත යුතු වේ.රක්ෂණ නියෝජිතයන්ගේ සේවය මේ සඳහා ලබා නොගත යුතුවේ.

04. ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් රක්ෂණ ආවරණයන් ලබාගැනීමේදී ඒ සඳහා දැරීමට සිදුවන පිරිවැය හා සේවාව ලබා ගැනීමට ඇති පහසුව සලකා ආයතන ප්‍රධානීන්ට තම අභිමතය පරිදි තම ආයතනයට වාසිදායක වන අයුරින් මෙම රක්ෂණ ආයතන දෙක අතරෙන් එක් ආයතනයක් තෝරා ගැනීමට හැකියාව ඇත.

05. මෙම රක්ෂණ ආවරණයන් පිළිබඳ වැඩිදුර තොරතුරු සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් / ජාතික රක්ෂණ භාර අරමුදලෙන් ලබා ගැනීමට කටයුතු කරනු මැනවි.

06. මේ චක්‍රලේඛය සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඩී. අබේසූරිය මහතා (දු.අ. 011-2484734) අමතා ලබා ගත හැක.

07. රථවාහන පමණක් ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ රක්ෂණය කිරීම සම්බන්ධයෙන් නිකුත් කළ 2007.12.18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/427 සහ 2008.03.13 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/427(1) මෙයින් අවලංගු කෙරේ.

08. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන 2009.09.15 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

09. මෙම චක්‍රලේඛය රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ www.treasury.gov.lk හෝ www.pfd.gov.lk යන වෙබ් අඩවිවලින්ද ලබාගත හැකිය.

එස්. අබේසිංහ
භාණ්ඩාගාර ලේකම්

**පිටපත්** :- 1. සභාපති, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - දැ.පි.
2. සභාපති, ජාතික රක්ෂණ භාර අරමුදල - දැ.පි.
3. විගණකාධිපති - දැ.පි.